හැදින්වීම

791/A පන්නිල දකුණ වසම බස්නාහිර පලාතේ කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ දකුණු භාගයේ දකුණු පලාත් සීමාවේ පිහිටා ඇති අතර වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වූවකි.වලල්ලාවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 60 අතර වූ මෙම වසම පොදු පහසුකම් වලින් ඌන හෙක්ටයාර් 333.75 භූමි ප්‍රමාණයකිනි යුක්තවෙයි.එසේම සදපානවත්ත,මහදුව.කනාන,දිදිදුව,පේඩිහේන,හිදම්පල කානගොඩ ආදී ගම් කිහිපයකින් යුතුත වන අතරම මුළු ජනග්‍රහනය 960 ක් පමණ වෙයි.

ඉතා විශාල වපසරියකින් යුක්ත මෙම පන්නිල දකුණ වසම තුල කනාන රක්ෂිතය ස්වාභාවිකත්වය අතර සුවිශේෂී වූවකි.වසමට වසර පුරාම අධික වර්ෂාපතනයක් ලැබෙන අතරම කෘෂිකර්මාන්තය මිනිසුන්ගේ ප්‍රධාන ජීවනෝපාය වෙයි.ඒ අතර වී වගාව ,තේ වගාව.රබර් වගාව ප්‍රධාන වෙයි.

දක්ෂිණ වෙඟි අධිවෙඟි මාර්ගය හරහා දිවෙන 791/ඒ පන්නිල දකුණ වසම ගංවතුරින් පීඩාවට ලක්වන ප්‍රදේශයක් බව කණගාටුවට කරුණකි.

කොට්ඨාශයට ප්‍රවේශ වීම.

අලුත්ගම - මතුගම ප්‍රධාන මාර්ගයේ ලෙව්වන්දුව හන්දියෙන් 2 km පමණ අවිත්තාව දෙසට ගමන් කිරීමේදී පන්නිල ගම්මානය හමුවේ. පාරේ දකුණු පසින් අධිවේගී මාර්ගය දක්වා 791 A පන්නිල දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාශයයි. කොට්ඨාශයේ ආරම්භය පන්නිල 1 කණුව ජයතිස්ස මහතාගේ නිවස අසළ පිහිටි පාලමයි. ඉන් ඉදිරියට 2 km පමණ වන තෙක් ප්‍රධාන මාර්ගයෙහි දකුණු පසින් කොටඨාශය විහිද යන අතර අධිවේගී මාර්ගය ළඟින් අවසන් වේ.

ලෙව්වන්දුව හන්දියෙන් ඇතුළු වී අධිවේගී මාර්ගය දක්වා දිව යන ප්‍රධාන මාර්ගයට සම්බන්ධ කර ඇති

කන්නන්ගරගොඩ පාර

ප්‍රේමරතනාරාම පන්සල පාර

මහදුව පාර

කනත්ත පාර

එගොඩහවත්ත පාර

මල්බෙරිය (සඳපහන වත්ත) පාර

කානගොඩ පාර

පේඹිහේන පාර

යන අතුරු ප්‍රවේශ මාර්ග තුළින් වසමට ඇතුළු විය හැක.

වසමේ පිහිටීම

නම සැකසුණු ආකාරය

අතීතයේ විශාල පන් විලක් තිබූ බවත් ඒ නිසාම ඒ ගමට පන්නිල වශයෙන් නම ලැබී ඇති බවත් ප්‍රදේශ වාසීන්ගේ අදහසයි

වසමට අයත් ගම්මාන

කානගොඩ

දිද්දූව

පේඹිහේන

කන්නන්ගරගොඩ

මහදූව


සඳපහන වත්ත

කනාන

කනාන කන්ද

හිදම්පල

කොට්ඨාශයේ ස්වභාවය -	ග්‍රාමීය ස්වභාවයකි
භූමියේ සාමාන්‍ය ස්වභාවය -	කඳු සහිත පෙදෙසකි
පස්වල ස්වභාවය -	මැටි මිශ්‍ර පසකි
සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය -	85°f
සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය -	200 – 300 mm
ප්‍රධාන වශයෙන් වර්ෂාව ලැබෙන කාලය -	නිරිත දිග මෝසම්
සුළු වශයෙන් වර්ෂාව ලැබෙන කාලය -	ඊසාන දිග මෝසම් හා සංවහන ධාරා


මුළු ජනගහනය
964
වයස් කාණ්ඩය අනුව
අවු. 50 ට අඩු 70
අවු. 5-14 දක්වා 84
අවු. 15-18 දක්වා 86
අවු. 19 30 දක්වා 287
අවු. 30-60 දක්වා 304
අවු. 60 ට වැඩි 133
ජාතිය අනුව
සිංහල 822
දෙමළ 142
ආගම අනුව
බෞද්ධ 822
හින්දු 142
සහනාධාර අනුව
සමෘධි 21
මහජන ආධාර 12
අධ්‍යාපන මට්ටම අනුව
කිසිදා පාසල් නොගිය 40
1- 5 වසර තෙක් අධ්‍යාපනය ලැබූ 68
6 11 වසර තෙක් අධ්‍යාපනය ලැබූ 117
සාමාන්‍ය පෙළ සමත් 315
උසස් පෙළ සමත් 123
උපාධි හා ඊට ඉහළ 53
රැකියා ස්වාභාවය අනුව
රාජ්‍ය අංශයේ නියුතු 267
අර්ධ රාජ්‍ය අංශයේ නියුතු 229
පෞද්ගලික අංශයේ නියුතු 57
විදේශ රැකියා 18
ස්වයං රැකියා 17
දෛනික රැකියා 33
ආදායම අනුව
5000 ට අඩු 24
5000 - 10 000 120
10 000 - 25 000 55
25 000 - 50 000 20